

# ඔබේ දරුවාගේ භාෂා කුසලතා වර්ධනය .........

## දෙමාපියන්ට සිතන්නට යමක්




ශ්‍රියාණි මද්දුමගේ

දරුවා ලෝකය හඳුනා ගන්නේ තම මාලියන් ගෙනි. ඔහුට මුලින්ම සවනට වැටෙන්නේ ඔහු හඳුනාගැනීමට උත්සාහ ගන්නේත් තම මවගේ කටහඬ යි. ඔහු මෙලොවට බිහිවුණ දින සිට ඔහුගේ වර්ධනයේ සෑම අවස්ථාවකදීම දරුවාගේ භාෂා හැකියාව වර්ධනය කිරීමෙහි ලා මවක වශයෙන් ඔබට කළ හැකි දෑ බොහෝ වෙයි.

දරුවා ලිවීමට හා ඉගෙනීමට පෙරාතුව ඔහු හෝ ඇය ඒස ඥහා සූදානම් කරවීමත් ඒ සඳහා අවශ්‍ය වන දැනුම හැකියාවන් හා පුරුද්ද දරුවා තුළ වර්ධනය කරවීමත් මව්පියන් සතු වගකීමකි. අද අපි සාකච්ඡා කරන්නේ දරුවාගේ භාෂා ඥානය දියුණු කිරීමෙහි ලා ඔබ සතු කාර්භාරය පිළිබඳවයි.

දරුවා ඉපදී පාසල් යන වයසට පැමිණෙන තෙක් ළමා මනස සංවර්ධනයෙහි ලා ඔබට කළ හැකි දෑ

***ඉපදී මාස තුන වන තෙක්***



දවස පුරා දරුවා සමග කතා කරමින් දරුවාට සවන් දෙන්න. නගන ශබ්ද වල අර්ථය තේරුම් ගැනීමට උත්සාහ ගනිමින් දරුවා සමඟ කතා කරන්න. දරුවාට කිරි පෙවීමේ දී ද නෑවීමේදී ද ඇඳුම් ඇන්දවීමේ දී ද දරුවා හා කතා කරමින් ළදරු ගීත ගයන්න.

දරුවා යමක් ඉගෙන ගන්නා බව දැනෙන විට එය අගයන්න.

***මාස තුනත් අටත් අතර***

දරුවා සමඟ නිතර කතා කරමින් සෙල්ලම් කරන්න. දරුවාට කතා කරන විට වචනයෙන් හා ක්‍රියාවෙන් එය පෙන්වන්න.

අන් අයෙකු සමඟ කතා කරන විට  සවන් දීමේ වැදගත් කම දරුවාට .අවබෝධ කරගන්න.

දරුවා අතට යමක් දී එය නැවත ඔබ අතට දීමට දරුවාට උගන්වන්න.

***මාස අටත් දොළහත් අතර***

දරුවාට දිනපතා කතන්දර කියන්න. දරුවා උකුල උඩ තබාගෙන පින්තූර පෙන්වමින් කතන්දර කියා දෙන්න. බෝනික්කන් මපට් සහ සෙල්ලම් බඩු යොදා ගනිමින් කතන්දර පවසන්න.

***මාස දොළහත් දහ අටත් අතර***

දරුවා කැමති දෑ මෙන්ම ඔහු හැකියාවක් දක්වන ආකාරයේ සෙල්ලම් කිරීමට ඔහුට සළස්වන්න. උදාහරණ - දරුවාට දුරකථන සංවාද කරන අයුරින් සෙල්ලම් කිරීමට ඉඩ සළස්වන්න. . ලී හැඳි ප්ලාස්ටික් වීදුරු වළන් වැනි ගෙදර උපකරණ වලට සමාන සෙල්ලම් බඩු ලබා දෙන්න.

***වයස මාස දහඅටත් විසි හතරත් අතර***

දරුවාට වර්තමානය හා අනාගතය හා අතීතය ගැන කතා කිරීමට ඉඩ හරින්න. උදාහරණ - දරුවා අතීතයේ කළ දෙයක් හෝ අනාගතයේ කිරීමට යන දෙයක් ගැන කතා කිරීමට පොළඹවන්න. අලුත් වචන කියා දෙන්න. දරුවා කළ දෑ ගැන නිදාගැනීමට පෙර කතා කරන්න.

***වයස මාස විසි හතරත් තිස් හයත් අතර***

දරුවාට සහභාගිවිය හැකි ක්‍රියාකාරකම් කිරීමට ඉඩ හරින්න. කතන්දර කියා දෙන්න. උදාහරණ - දරුවාට ගුරුතුමියක් ලෙස හෝ වෛද්‍යවරියක් ලෙස සැරසී සෙල්ලම්කිරීමට ඉඩ හරින්න. කියවීමට විශේස වෙලාවක් නියම කරන්න. එකම පොත් නැවත නැවත කියවමින් දරුවාට හුරු වචන ඔහු ලවා කියවන්න.

**වයස අවුරුදු තුනත් පහත් අතර වන දරුවන් ලිවීමට හා කියවීමට හුරු කළ හැක්කේ කෙසේ ද?**

ඔබේ දරුවා සෙල්ලම් කිරීමට දිවීමට හා ගොඩනැගිලි තැනීමට :ඊමසකාසබට ඊකදප්නි* ප්‍රිය කරයි නම් ඒවා ඔහු ලිවීමට හා කියවීමට සූදානම් කරන ක්‍රියාවන් බවට පරිවර්තනය කරන්න.

දරුවාට සම වයසේ දරුවන් හා සෙල්ලම් කිරීමේ අවස්තාව ලබා දෙන්න. එවිට දරුවා අනෙක් අය හා සන්නිවේදනය කිරීමට ඉගෙන ගනියි.

දරුවා සමඟ නිරතුරුවම සංවාදයේ යෙදෙන්න. ඔබේ අදහස් ඔහු සමඟ බෙදා ගන්න. ඔහු නොදන්නා වචන වල අර්ථය කියා දෙන්න.

අකුරු වචන ඉලක්කම් යොදා ගනිමින් සෙල්ලම් කිරීමට ඉඩ සළස්වන්න. ගණන් කිරීමට උගන්වන්න. දරුවාට ගීත සහ තාලයට ගැයීම හුරු කරවන්න.

උද්‍යාන කෞතුකාගාර කඩ සාප්පු ප්‍රජා උත්සව වැනි ස්ථාන වලට දරුවා රැගෙන යන්න. එහිදී ද ඔහු වචන ඉගෙන ගැනීම මෙන්ම ලෝකය ගැන අවබෝධය ද පුළුල් කර ගනියි.

ඔබට එදිනෙදා ජීවිතයේ දී ලිවීම කියවීම කෙතරම් ප්‍රයෝජනවත් වන්නේ ද යන්න දරුවාට ඒත්තු ගන්වන්න.

ඔබ බඩු ලැයිස්තුවක් සකස් කිරීම සිතියමක් කියවීම පුවත්පතක් කියවීම වැනි දෑ  කරන විට දරුවා ලිවීමේ හා කියවීමේ ප්‍රයෝජනය සිතට ගනියි.

සංඥා පොත් වැකි පුවත්පත්  යනාදිය ගැන දරුවා සමඟ කතා කරන්න.  දරුවාට ඒවා කියවීමට අවධානය ලබා දෙන්න.

දරුවාට කියවීමේ ආභාව ඇතිවන විට ඔහුට පුස්තකාල කාඩ් පතක් ලබා දෙන්න.

ඇඳීම ලිවීම හා පොත් කියවීමට දරුවා උනන්දු කරවන්න.

දරුවාට ඇඳීමට අවශ්‍ය වන දකෑ පොත් පත් යනාදිය ඔහුට පහසුවෙන් ගත හිකි තැනක තබන්න.

දරුවා ඇන්ද පින්තූර විස්තර කරන ලෙස ඔහුට කියන්න. දරුවාගේ උත්සාහය අගය කරන්න.

***සාමාන්‍ය වැඩිහිටියෙකුගේ වාග් මාලාව යටත් පිරිසෙයින් වචන 10000 කින් වත් සමන්විත වන අතර උගත් කථිකයකුගේ වාග් මාලාව වචන 100000 කින් වත් සමන්විත වේ.***

පරිගණක සෙල්ලම් හා වීඩියෝ දරුවාට නැරඹීමට පෙර ප්‍රවේසමෙන් තෝරා ගන්න. (ළමා සංවර්ධන විශේෂඥයන්ගේ මතය වන්නේ පෙර පාසල් වයසේ දරුවන්ට දිනකට පැය එකකට දෙකකට වඩා රූපවාහිණී හා පරිගණක වැඩ සටහන් සුදුසු නොවන බවයි)

**දරුවාගේ භාෂා කුසලතාව වර්ධනය කිරීමෙහි ලා කතන්දර කීමේ ඇති වැදගත් කම**

දරුවාගේ පූර්ව භාග සංවර්ධනයෙහි ලා කතන්දර කීම බෙහෙවින් වැදගත් වන බව ළමා සංවර්ධන විශේෂඥයෝ පෙන්වා දෙති. සාමාන්‍ය වැඩිහිටියෙකුගේ වාග් මාලාව යටත් පිරිසෙයින් වචන 10000 කින් වත් සමන්විත වන අතර උගත් කථිකයෙකුගේ වාග් මාලාව වචන 100000 කින් වත් සමන්විත වේ. උගත් වැඩිහිටියන් සංකීර්ණ වචන භාවිතා කරන්නේ කතා කිරීමේ දී නොව ලිවීමේ දී ය. එහෙත් දරුවන් කියවීම හා ලිවීම ඉගෙන ගන්නා අවධියේ දී මුල් තැන හිමි වන්නේ ඔවුන්ගේ කතා හැකියාවට ය. ළමා සංවර්ධනය පිලිබඳ පර්යේෂකයන්ගේ මතයට අනුව දරුවාගේ ලිවීමේ හැකියාව දියුණු වීම සඳහා හොඳින් සම්පූර්ණ වාග් මාලාව (කතා හැකියාව) මූලිකව වැදගත් වේ. දරුවා කියවීමට සූදානම් කරවීමේ මූලික අදියර වන්නේ දරුවාට වචන වල අදහස තේරුම් ගැනීමට උපකාරී වීමයි. උදාහරණයක් වශයෙන් නවත්වන්න යන මාර්ග සංඥාව දුටු විට රිය නතර කරන බව දකින දරුවා එම සංඥාවේ අදහස තේරුම් ගනියි. දරුවාට අප ජීවත් වන ලෝකය හඳුනාගැනීමට උදව් වීම සඳහා යොදා ගත හැකි ඵලදායී මාධ්‍යයක් ලෙස කතන්දර කීම හඳුන්වා දිය හැකිය. කතන්දර කීම යනු ඔහු සංවාදයෙන් ඔබ්බට යන සමාජමය අත්දැකීමක් ලෙස අර්ථකතනය කළ හැකි ය. එය දරුවාගේ බහ තේරීමේ සිට භාෂාව ඉගෙනීම දක්වා රුකුල් දෙන පාලමක් ලෙස හැඳින්විය හැකි ය.

දරුවා තමන් අසන කතන්දරය සංඥා රූප මගින් මතකයේ තබා ගනියි. කතන්දර යනු බාහිර දෙයක් නොවන බවත් තමා ජීවත් වන ලොකයේ ම අත්දැකීම් බවත් ඒවාට සමීප විය හැක්කේ භාෂාව  මගින් බවත් දරුවාට අවබෝධ වෙයි.

කියවීමේදී අවශ්‍ය වන අර්ථ දැක්වීම මෙන්ම ලිවීමේ දී භාෂාව නිර්මාණාත්මකව හැසිරවීම සඳහා අඩිතාලම වැටෙන්නේ කතන්දර මගිනි. අලුත් වචන යෙදුම් ගීත ශබ්ද නැගීම්  කටහඬ පාලනය බෙස් උච්ඡාරණය වැනි භාෂාවේ විශාල පරාසයක දැනුම මේ මගින් දරුවාට ලැබේ. ලොකයේ පොහොසත් බව මිනිස් ජීවිතය හා එහි ගුණාංග සංස්කෘතික ලක්ෂණ සිදුවීම් මගින් ද හොඳ නරක පිළිබඳව දරුවාට අවබෝධයක් මේ මගින් ලැබෙයි.

**දරුවාගේ මතක ශක්තිය වැඩිකිරීමට ඔබට කළ හැකි දෑ**

1 ඔබ හා ඔබේ දරුවා එක්ව ලද අත්දැකීමක් මතක් කොට දරුවාට එය නැවත ගොඩ නැගීමට උදව් වන්න. උදාහරණ - උපන්දින සාදයක් විනෝද ගමනක්

2 දරුවාට දැනෙන ආකාරයට එම අත්දැකීම පැවසීමට ඉඩ හරින්න. දරුවන් තම අවධානය යොමුකරන්නේ වැඩිහිටියන්ගේ සිත් ගන්නා දේවලට වඩා වෙනස් දේ වලටයි. ඔබේ දරුවාට වැදගත් වූයේ කුමක් ද යන්න හඳුනාගැනීමට උත්සාහ ගන්න.

3 ඔබේ දරුවාට සිය අත්දැකීම් කතන්දරයක් ලෙස පැවසීමට උදව් කරන්න.

4 දරුවාගෙන් විවෘතව ප්‍රශ්න අසන්න. එකකට වඩා ඇති ප්‍රශ්න ඇසීමෙන් තම අත්දැකීම් ගැන තමා සිතන අයුරින් විස්තර කිරීමට පෙළඹේ. දරුවා ප්‍රතිචාර නොදක්වයි නම් ඔහුට කරුනු මතක් කර දෙමින් කතා කිරීමට උනන්දු කරවන්න.

## ආදරයේ මහිම



*නිව් යෝර්ක්  මහජන පුස්තකාලයේ වාර්තා අනුව මේ දක්වා වැඩිම පිරිසක් කියවූ ආදර නවකතා තුන නම් කරන්නට ඔබට හැකි ද?*

*එමලි බ්‍රොන්ටේ ගේ වදරි හයිට්ස් මුල් තැනට එයි. දෙවන තැනට වැඩිම පිරිසක් කියවා ඇත්තේ ලියෝ ටොල්ස්ටෝයි ගේ ඇනා කැරනිනා කවකතාවයි. තුන් වැනි තැන ලැබෙන්නේ විලියම් ශේක්ස්පියර් ගේ රෝමියෝ ජුලියට් නවකතාවට ය.*